**අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 43 - 2022**

---

**1. විගණන මතය**

1.1 අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 43 හි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2022 වර්ෂයට අදාළව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 43 ට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර එම කාරක සභා 43 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 28 ක් වෙත 2021 දෙසැම්බර් මස ලැබී තිබුණු කොම්පෝස්ට් හලන යන්ත්‍ර/කොම්පෝස්ට් කැබලි කිරීමේ යන්ත්‍ර වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | යන්ත්‍ර වල වටිනාකම දිස්ත්‍රික් කාර්යාලයෙන් ලබා ගෙන ගිණුම් ගත කරන බව | ගොවිජන සේවා කාරක සභාව සතු යන්ත්‍ර සහ උපකරණ වටිනාකම් හඳුනාගෙන ගිණුම් ගත කල යුතුය |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 06 ක් විසින් කොම්පෝස්ට් පොහොර විකුණුම් වලට අදාලව වෙළඳ ගිණුමක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අවසන් තොගයේ පිරිවැය අගය කිරීමට නොහැකි අතර ආරම්භක තොගයේ ද වටිනාකමක් සොයා ගැනීමට නොහැකි වූ බැවින් වියදම හා ආදායම අතර වෙනස ගිණුම් ගත කර ඇති බව | වෙළඳ ගිණුම සැකසීමට කටයුතු කල යුතුය |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 04 ක එකතුව රු.647,540 ක් වූ කල් ඉකුත් වූ කෘෂි රසායන ද්‍රව්‍ය හා පොහොර තොග සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | මෙම තොග ඉවත් කර ගැනීම සඳහා තොග පාලක මණ්ඩලයක් වෙත ඉදිරිපත් කර ඇති අතර එමගින් ලබා දෙන උපදෙස් අනුව කටයුතු කරන බව | තොග වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 08 ක් වෙත පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු යන්ත්‍ර හා | ඉදිරියේ දී එම වටිනාකම් ලැබුණු පසු ජංගම නොවන | කාරක සභාව සතු සියලු ස්ථාවර වත්කම් තක්සේරු කර ගිණුම් |

| | | | |
|---|---|---|---|
| | උපකරණ 03 ක් කාබනික පොහොර කැබලි කිරීමේ යන්ත්‍ර 02 ක් ගොයම් පැල සිටුවීමේ යන්ත්‍ර 08 ක් පරිගණක යන්ත්‍ර 03 ක් සහ තණකොල කපන යන්ත්‍ර 06 ක වටිනාකම සහ යන්ත්‍ර වර්ග 10 කට අදාල උපකරණ 26 ක හා බීජ රෝපණය කිරීමට යොදා ගන්නා තැටි 24000 ක වටිනාකම හඳුනාගෙන ජංගම නොවන වත්කම් වශයෙන් ගිණුම් ගත කර නොතිබුණි. | වත්කම් ලෙස හඳුනා ගැනීමට පියවර ගන්නා බව | ගත කල යුතුය |
| (ඉ) | කහටගස්දිගිලිය ගොවිජන සේවා කාරක සභාවේ වැඩි මිල පොහොර බඩඉරිඟු වලට අදාල වෙළඳ ගිණුමට රු.88,614,900 ක විකුණුම් ආදායමක් ගෙන නොතිබුණු අතර, වැඩි මිල බඩඉරිඟු පොහොර වලට අදාල දල ලාභය හෝ අලාභය මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය තුළ හඳුනාගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | වෙළඳ ගිණුම් නිවැරදිව සකසා නිවැරදි දළ ලාභය හෝ අලාභය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුල හඳුනාගත යුතුය |
| (ඊ) | මඩාටුගම ගොවිජන සේවා කාරක සේවා සභාවේ 2012 සිට 2021 දෙසැම්බර් දක්වා වසර 09 ක පමණ කාලයක සිට හඳුනා නොගත් බැර ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම ඉදිරියට එමින් පැවතුණු රු.786,172 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම ශේෂය පිළිබඳ කරුණු සොයා ගෙන ඉදිරි වර්ෂ වල එය නිවැරදි කර ගිණුමේ තැබීමට කටයුතු කරන බව | පැරණි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය |
| (උ) | පලුගස්වැව ගොවිජන සේවා කාරක සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට යූරියා පොහොර ඉතිරි තොගය රු.4,227,900 ක් වුවද, වෙළඳ ගිණුමෙහි එය ඇතුලත් නොකිරීම නිසා යූරියා පොහොර ලාභය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. | අදහස් දක්වා නැත | වෙළඳ ගිණුම් නිවැරදිව සකස් කිරීමට කටයුතු කල යුතුය |
| (ඌ) | සමාලෝචිත වර්ෂය තුලදී ආඩියාගල ගොවිජන සේවා කාරක සභාව විසින් මිලදී ගෙන තිබුණු රු.212,750 ක් වටිනා කාර්යාල උපකරණ හා රු.60,626 ක් වටිනා පරිගණක හා උපාංග ජංගම නොවන වත්කම් යටතේ ගිණුම් ගත කර නොතිබුණි. | අදහස් දක්වා නැත | ස්ථාවර වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල දැක්විය යුතුය |
| (එ) | සාලියපුර ගොවිජන සේවා කාරක සභාවේ වැඩි මිල පොහොර බඩ ඉරිඟු විකුණුම් රු.536,625 ක් හා ගැණුම් රු.944,018 ක් අඩුවෙන් වැඩි මිල පොහොර (බඩ ඉරිඟු) වෙළඳ ගිණුමට ගෙන තිබුණි. | නිවැරදි කරන බව | විකුණුම් ආදායම් නිවැරදිව ලාභ අලාභ ගණනයට ගැලපිය යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඒ) | බැංකුව මගින් ඉදිරිපත් කර තිබුණු ශේෂ සනාථන ලිපිය අනුව 2022 දෙසැම්බර් 31 දිනට සාලියපුර ගොවිජන කාරක සභාවේ පොහොර ආයෝජන ගිණුමේ ශේෂය රු.36,304,023 ක් වූ අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව එම ශේෂය රු.50,304,024 ක් වීමෙන් පොහොර ආයෝජන ගිණුමේ ශේෂය රු.13,999,999 කින් වැඩියෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ගෙන තිබුණි. | නිවැරදි කරන බව | ජංගම වත්කම් වටිනාකම් නිවැරදිව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතුය |
| (ඔ) | 2022 දෙසැම්බර් 31 දිනට රාජාංගනය ගොවිජන සේවා කාරක සභා ගබඩාවේ භෞතිකව පැවති රු. 23,550 ක් වටිනා MOP පොහොර තොගය හා රු.287,670 ක් වටිනා යූරියා (වී වගාව) පෙහොර තොගය ඉතිරි තොගයට ඇතුලත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වසරේ මුළු වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | එම යූරියා තොග සඳහා ලාභ අලාභ ගණනය නොකල අතර එම තොග 2022 /23 මහ කන්නයේ රජය පොහොර ලබා දී එම මුදලම නැවත ලබා දීම හේතුවෙන් අවසාන තොගය සඳහා ගැලපීම් කිරීමට කටයුතු නොකල බව | ඉතිරි තොග මූල්‍ය ප්‍රකාශන තුල දැක්විය යුතුය |
| (ඕ) | කෝන්වැව ගොවිජන සේවා කාරක සභාවේ රු.327,800 ක බිත්තර වී ආරම්භක තොගය වෙළඳ ගිණුමට සහ රු.70,200 ක කාමර කුළී ආදායමක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි. | මහ කන්නයේ ආරම්භක තොගය ලෙස සටහන් නොවූ හෙයින් වෙළඳ ගිණුමේ ආරම්භක ශේෂයට ඇතුලත් නොකරන ලද බව | ආරම්භක තොගය වෙළඳ ගිණුමට ඇතුලත් කල යුතුය |
| (ක) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කපුගොල්ලෑව ගොවිජන සේවා කාරක සභාවේ ගබඩාවේ පැවති රු.5,360,000 ක වටිනාකමැති යූරියා කිලෝග්‍රෑම් 26,800 ක් තොගය ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මෙය නිවරදි කිරීමට කටයුතු කරන බව | ඉතිරි තොග නිවැරදිව ගිණුම් ගත කල යුතුය |
| (ග) | ප්‍රමාණාත්මක තොග ගිණුම සහ තොග සත්‍යාපන වාර්තාව අනුව මිහින්තලේ ගොවිජන සේවා කාරක සභාවේ වී සඳහා යූරියා අවසන් තොගය රු.11,911,300 වුව ද, වී සඳහා යූරියා වෙළඳ ගිණුමෙහි අවසන් තොගයක් සටහන් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | අවසන් තොගය ගිණුම් ගත කල යුතුය |
| (ච) | බුල්නෑව ගොවිජන සේවා කාරක සභාවේ ප්‍රමාණාත්මක තොග ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 480,000 ක් වූ යූරියා පොහොර තොගය හා රු.5,825,430 ක් වූ MOP පොහොර තොගය වෙළඳ ගිණුම් වල දක්වා නොතිබුණි. | මෙම පොහොර තොග අලෙවි කර සියලු මුදල් නියෝජ්‍ය කොමසාරිස් වෙත යැවිය යුතු බැවින් වෙළඳ ගිණුම සැකසීමේ දී මෙය සැලකිල්ලට ගෙන නොමැති බව | තොග ශේෂ නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වලට ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| (ජ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශ්‍රාවස්තිපුර ගොවිජන සේවා කාරක සභාවේ පැවති රු.1,305,000 ක් වටිනා බඩ ඉරිඟු යූරියා පොහොර තොගය හා රු.5,376,600 ක් වටිනා වී වගාව සඳහා යූරියා පොහොර තොගයේ වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | මෙම තොගය ප්‍රමාණාත්මක තොග ගිණුමේ සටහන් කර ඇති බව සහ ඉදිරියේ දී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ද ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | තොග ශේෂ නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වලට ගත යුතුය |
| (ට) | ඇලයාපත්තුව ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයට අදාල බඩ ඉරිඟු පොහොර අලෙවි ආදායම ලෙජරය අනුව රු.38,898,750 ක් වූ නමුත්, වෙළඳ ගිණුමට රු.38,644,500 ක් ලෙස රු. 254,250 ක් අඩුවෙන් ගෙන තිබුණි. | තොග පොත් නිවැරදි කිරීමේ දී ඇති වූ වෙනස් වීම් නිසා වෙළඳ ගිණුමට අලෙවි ආදායම අඩුවෙන් සටහන් වී ඇති බව සහ ඉදිරියේ දී එය සමුච්චිත අරමුදලට ගලපා නිවැරදි කරන බව | තොග පොත් නිසි පරිදි යාවත්කාලීනව පවත්වා ගත යුතුය |
| (ඩ) | පදවි පරාක්‍රමපුර ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩාවේ පැවති ERP පොහොර කිලෝග්‍රෑම් 30,000 ක් වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී එය ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | තොග වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුය |
| (ත) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සම්පත් නුවර ගොවිජන සේවා කාරක සභාවේ ගබඩාවේ පැවති රු.4,766,630 ක වටිනාකමැති යූරියා කිලෝග්‍රෑම් 19,761 ක් සහ බිත්තර වී බුසල් 179 ක් තොගය ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | අදහස් දක්වා නැත | තොග ශේෂ වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය |
| (ද) | පේමඩුව ගොවිජන සේවා කාරක සභාවේ වී පොහොර යූරියා, බඩ ඉරිඟු පොහොර යූරියා සහ MOP පොහොර වලට අදාල අවසන් තොග වටිනාකම් පිළිවෙලින් රු.1,850,400, රු.600,000 සහ රු. 4,875,000 ක් වූ අතර එම වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ගෙන නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | තොග ශේෂ නිවැරදිව ගිණුම්ගත කල යුතුය |
| (න) | අනුරාධපුර ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 1,857,660 ක් වූ වී යූරියා පොහොර තොග වටිනාකම හා රු. 3,710,070 ක් වූ MOP පොහොර තොග වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ගෙන නොතිබුණි. | කාරක සභාව වෙත තොගය ලබා දී විවිධ අවස්ථාවල තීරණය කරනු ලබන මිල ගණන් යටතේ විකුණුම් සිදු කර එහි සම්පූර්ණ මුදලම දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය | තොග වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කල යුතුය |

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා දෙකක වත්කම් විෂයන් දෙකකට අදාලව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති වටිනාකම් හා ශේෂ පිරික්සුමේ දක්වා ඇති වටිනාකම් අතර එකතු වටිනාකම රු.188,075 ක නොසැසඳීම් විය. | අදහස් දක්වා නැත. | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 05 ක ලෙජර් ගිණුම් 09 ක දැක්වුණු ශේෂ සහ මූල්‍ය ප්‍රකාශන වලට අනුව දැක්වුණු ශේෂ අතර එකතු වටිනාකම රු.445,229 ක නොසැසඳීමක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 03 ක තොග පොත් වල දැක්වුණු ශේෂ සහ භෞතික තොග සත්‍යාපන වාර්තා අනුව දැක්වුණු තොග ශේෂ අතර එකතු වටිනාකම රු.1,052,590 ක නොසැසඳීමක් විය. | ඉදිරි ගිණුම් වාර්තාවෙන් නිවැරදි කරන බව | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය |
| (ඈ) | ඇලයාපත්තුව හා මුරියාකඩවල ගොවිජන සේවා කාරක සභා වල තොග අයිතම තුනකට අදාලව තොග පොත් අනුව ශේෂ සහ ප්‍රමාණාත්මක තොග ගිණුමේ දැක්වෙන තොග ශේෂ අතර එකතුව රු. 315,662 ක නොසැසඳීමක් විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 05 ක මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වුණු තොග ශේෂ සහ තොග පොත් හා තොග සත්‍යාපන වාර්තා අනුව තොග ශේෂ අතර එකතු වටිනාකම රු.8,090,324 ක නොසැසඳීමක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය |
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා 08 ක මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන තොග ශේෂ සහ තොග සත්‍යාපන වාර්තාව සහ/හෝ ප්‍රමාණාත්මක තොග ගිණුමේ දැක්වෙන ශේෂ අතර එකතු වටිනාකම රු.12,365,458 ක නොසැසඳීමක් විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය |
| (උ) | කහටගස්දිගිලිය ගොවිජන සේවා කාරක සභාවේ වෙළඳ ගිණුමට අනුව බඩ ඉරිඟු පොහොර විකුණුම් වටිනාකම සහ බඩ ඉරිඟු පොහොර බෑමේ කුලී සහ ලෙජර් ගිණුම් වල එම | අදාල ගිණුම් වල දැක්වෙන වටිනාකම සහ ලෙජර් ගිණුම් වල ඇති වටිනාකම් එකතුව නිවැරදිව සටහන් කිරීමට | නිවැරදි ශේෂය හඳුනාගෙන ගිණුම් වලට ගැලපීම් කල යුතුය |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම් අතර එකතු වටිනාකම රු.88,427,024 ක නොසැසදීම් විය. | කටයුතු කරන බව | |
| (ඖ) | කල්ලංචිය ගොවිජන සේවා කාරක සභාවේ ශේෂ පිරික්සුම අනුව පිරියත හා උපකරණ වල ශුද්ධ අගය සහ ස්ථාවර වත්කම් ලේඛනය අනුව එම ශේෂය අතර රු.1,174,022 ක නොසැසදීම් විය. | අදහස් දක්වා නැත. | නොසැසදීම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය |

**1.3.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 34 කට අදාල මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු. 62,809,580 ක වත්කම් විෂයන් 36 ක සහ රු. 187,804,875 ක වගකීම් විෂයන් 38 ක සහ කපුගොල්ලෑව ගොවිජන සේවා කාරක සභාවේ රු. 1,026,329 ක පොදු සංචිතය සහ කැබිතිගොල්ලෑව ගොවිජන සේවා කාරක සභාවේ රු. 243,906 ක ආදායම් අයිතමයක් ස්ථාවර වත්කම් ලේඛණය, අයිතිය තහවුරු කිරීමේ ලිපි, ශේෂ සනාථන ලිපි, තොග ලේඛනය, කාල විශ්ලේෂණය නොමැති වීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | 2023 ගිණුම් වාර්තාවල මෙම අඩුපාඩු සකස් කර නිවැරදිව තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය සටහන්, වාර්තා, ලේඛන ආදිය ඇතුලත් කරන ලෙස ප්‍රාදේශීය නිලධාරීන්ට ලිඛිතව උපදෙස් ලබාදීමට කටයුතු කරන බව | වත්කම් සහ වගකීම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.4 නීතී, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීතී, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 14 (3) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 02 ක වර්ෂ ගණනාවක සිට පැවත එන එකතුව රු. 2,269,633 ක් වූ ප්‍රවේණි මුදල් සම්බන්ධයෙන් යොමුගත වගන්ති අනුව කටයුතු කර නොතිබුණි. | මෙම ප්‍රවේණි මුදල් ගෙවිය යුත්තේ කාටද යන්න සොයා බලා එම මුදල් ගෙවීමට කටයුතු කරන බව | පනතේ විධි විධාන අනුව කටයුතු කල යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 52 (1) වගන්තිය | සෑම වගා කන්නයකටම පෙරාතුව කෘෂිකාර්මික වැඩසටහන් පිළියෙල කල යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී මේ අනුව කටයුතු කරන බව | පනතේ විධි විධාන අනුව කටයුතු කල යුතුය |
| (ඇ) | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 06 වගන්තිය | මුදල් සහ තොග සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා බලය ලබාදී ඇති නිලධාරීන්ගෙන් ගොවිජන සේවා කාරක සභා 30 ක් විසින් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. | ඉදිරියේ දී මේ අනුව කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය |
| (ඈ) | ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ 1987 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛයේ 17 (3) (අ) ඡේදය | සියලුම ගෙවීම් වවුචර් සඳහා ගොවිජන සේවා කාරක සභාවේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 04 ක එකතුව රු. 25,208,552 ක් වූ වවුචර් 213 ක් සම්බන්ධව ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | එම වවුචර් පත් කාරක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නිවැරදි කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය |
| (ඉ) | 2014 අගෝස්තු 22 දිනැති අංක 07/2014 (107 සංශෝධිත 03) දරන චක්‍රලේඛය | කමිටු ලිපිකරුට දෛනිකව අත රඳවාගතහැකි උපරිම මුදල රු. 10,000 ක් වුවද, ගොවිජන සේවා කාරක සභා 22 ක් විසින් සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 571 කදී රු.10,116 සිට රු.6,912,934 පරාසයක් දක්වා වූ මුදල් අත රඳවා ගෙන තිබුණි. | බැංකුවට ඇති දුර ප්‍රමාණය, ප්‍රවාහන අපහසුතා සහ පස්වරු 3.00 න් පසුව මුදල් ලැබීම මීට හේතු වන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 110 | හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 14 ක් විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | හානි පාඩු ලේඛනයක් සකස් කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 245 හා 257 | සහතික කරන ලද නිලධාරියා විසින් සියලුම වවුචර් සහතික කල යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 04 ක එකතුව රු. 65,394,478 ක් වූ ගෙවීම් වවුචර් 130 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන ලද බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය |
| (ඌ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 262 (2) | ගෙවන ලද සියළුම වවුචර්පත් වල හා ඒවා තහවුරු කරන ලියවිලි වලත් "ගෙවන ලදී" මුද්‍රාව යොදා එහි ගෙවූ දිනය සහ කෙටි අත්සන යෙදිය යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 05 ක එකතුව රු. 44,887,456 ක් වූ වවුචර් 146 කට අදාලව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ගෙවීම් කරන ලද වවුචර් සඳහා "ගෙවන ලදී" මුද්‍රාව යොදා ගෙවූ දිනය යොදා කෙටි අත්සන යෙදීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය |
| (එ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 264 (1) | සෑම ගෙවීම් වවුචර්පතකම සඳහන් මුදල් ආදායකයා විසින් ලබාගත් බවට කුවිතාන්සියක් මඟින් තහවුරු විය යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 09 ක එකතුව රු.112,385,282 ක් වූ වවුචර් 142 ක් සම්බන්ධයෙන් එම අවශ්‍යතාව ඉටුකර නොතිබුණි. | ඉදිරියේදී මේ අනුව කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය |

## 1.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දීර්ඝ කාලයක් තිස්සේ කටියාව ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙන එන ලද වටිනාකම රු.1,169,660 ක් වූ ගිණුම් ශේෂ 18 ක් දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ | 2023 වර්ෂයේ සමුච්චිත අරමුදලින් වෙන් කර හඳුනා ගත හැකි පරිදි මෙම පැරණි ශේෂ ඉවත් කිරීමට ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් වෙත දැනුවත් කර ඇති අතර මෙම ශේෂ | දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ අනුමැතිය මත සමුච්චිත අරමුදලට |

| | | |
|---|---|---|
| අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලට එරෙහිව ගලපා තිබුණි. | ඉවත් කිරීමක් සිදු කර නොමැති අතර අවශ්‍ය අවස්ථාවකදී හඳුනා ගත හැකි පරිදි ගිණුම් ශේෂයන් අඩු කර පමණක් ඇති බව | ගැලපීමට කටයුතු කළ යුතුය |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය යටතේ ගොවිජන සේවා කාරක සභා 43 න් කාරක සභා 39 කට අදාලව එකතු වටිනාකම රු. 13,469,488 ක අතිරික්තයක් වූ අතර ගොවිජන සේවා කාරක සභා 04 ක එකතු වටිනාකම රු.1,197,487 ක ඌණතාවයක් විය. ඉකුත් වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 38 කට අදාලව එකතු වටිනකාම රු.18,912,558 ක අතිරික්තයක් වූ අතර ගොවිජන සේවා කාරක සභා 05 ක එකතු වටිනාකම රු.963,320 ක ඌණතාවයක් විය. මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයන්ට කම්වු පොහොර ආදායම්, ස්ථාවර තැන්පතු පොලී ආදායම් සහ අක්කර බදු ආදායම් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම් වලට වැඩි මිල පොහොර විකුණුම් ආදායම් අඩු වීම සහ ආයතන හා පරිපාලන වියදම් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 05 ක් වෙත 2019 වර්ෂයේ දී ලැබී තිබුණු ජල උස මාපක වසර 04 කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද, ඒවා අදාල පාර්ශව වෙත ලබා දීමට කටයුතු කර නොතිබුණි. | ජල උස මාපක රැගෙන යන ලෙස ගොවි සංවිධාන දැනුවත් කලද මේ වන තෙක් ගෙන ගොස් නොමැති බව සහ වැව් වල ජලය පිරී ඇති බැවින් එය සවි කිරීමට අපහසු බවත් සහ ඉදිරියේ දී සවි කිරීමට කටයුතු කරන බව | අදාල ජල උස මාපක සවි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 25 ක වර්ෂ ගණනාවක සිට ගෙවිය යුතු ගිණුම් වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණු එකතුව රු.27,343,752 ක් වූ ශේෂ 154 ක් නිරවුල් නොකර, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | ගෙවිය යුතු වියදම් ඉදිරියේදී නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 28 ක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති වසර ගණනාවක් සිට ඉදිරියට ගෙන එමින් පවතින එකතුව රු. 31,194,861 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 186 ක් නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විගණනයේ පෙන්වා දී ඇති ඇති ලැබිය යුතු ශේෂ නිරවුල් කිරීම සඳහා ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස්තුමාට යොමු කර ඇත. | ලැබිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කල් ඉකුත් වූ නොමිලේ බෙදා දීම සඳහා ලද කාබනික දියර පොහොර ලීටර් 119 ක්, Eco Bio ජෛව දියර පොහොර කිලෝග්‍රෑම් 810 ක්, රු.3,929 ක් වටිනා කෘෂි රසායන තොගයක් භෞතිකව නොමැති මූල්‍ය ප්‍රකාශන වල පැවති රු.138,034 ක් වූ තොග ශේෂ 09 ක් ද රු.326,325 වූ ගෝල්ඩන් දියර පොහොර බෝතල් 916 ක් සහ රු.38,720 ක් වූ රයිසෝඩන් දියර පොහොර බෝතල් 44 ක් ගොවිජන සේවා කාරක සභා 05 ක ගබඩා තුළ පැවතුණි. | තොග පොත් වලින් ඉවත් කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව | කල් ඉකුත් වීමට පෙර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා බල ප්‍රදේශ 13 ක පැවති වැව් 59 ක් වාරි ඇල මාර්ග 111 ක් හා කෘෂි මාර්ග 87 ක් ප්‍රතිසංස්කරණය කළ යුතුව පැවතුණි**.** | අලුත්වැඩියා කල යුතු වැව් හා කෘෂි මාර්ග සම්බන්ධයෙන් දැනුම් දී ඇති බව | ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් සිදු කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඊ) | කැකිරාව ගොවිජන සේවා කාරක සභාවේ රු.2,069,576 ක් වටිනා දිගුකාලීන ණය ශේෂය වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කල ද, එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවෙන් ලැබුණ යන්ත්‍රෝපකරණ සඳහා ගෙවිය යුතු ණය මුදලක් බව සහ ඉදිරියේ දී එය නිරවුල් කරන බව | අදාල ණය ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය |
| (උ) | ගොවීන්ගෙන් අයකරගත් එකතුව රු.279,957 ක් වූ රක්ෂණ මුදල් ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත යැවීමට කටයුතු නොකර මඩාටුගම ගොවිජන සේවා කාරක සභාවේ රඳවාගෙන තිබීම හේතුවෙන් ගොවීන් වෙත අදාල රක්ෂණ ප්‍රතිලාභ ලැබීමට නොහැකි වී තිබුණි. | මෙම ශේෂය දීර්ඝ කාලයක් තිස්සේ එන ශේෂයකි. මෙය නිරවුල් කර ඉදිරියේ දී අදාල ආයතනයට ගෙවීමට කටයුතු කරන බව | අදාල මුදල් කඩිනමින් ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත යැවීමට කටයුතු කළ යුතුය |
| (ඌ) | මුරියාකඩවල ගොවිජන සේවා කාරක සභාවේ 2011 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම වෙනුවෙන් ලියන ලද රු.450,000 ක් වටිනා චෙක්පතක් කාරක සභාවේ නිළධාරියෙකු විසින් ඔහුගේ පෞද්ගලික ගිණුමකට බැර කර ගෙන තිබුණු අතර එම මුදල හා ඊට අදාල පොලී මුදල අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන හෝ එම මුදල අය කර ගැනීමට ගොවිජන සේවා කාරක සභාව විසින් කටයුතු කර නොතිබුණි. | එම මුදල් සම්බන්ධයෙන් නියෝජ්‍ය කොමසාරිස්ගෙන් උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු කරන බව | අදාල මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (එ) | ගම්බිරිගස්වැව ගොවිජන සේවා කාරක සභාවේ සේවයේ නියුතුව සිටි නිළධාරිනියකගෙන් තොග ඌණතාවයක් සම්බන්ධයෙන් අය විය යුතු 2014 වර්ෂයේ සිට පැවත එන රු.163,215 ක හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනයේ ණය ගැතියන් ලෙස දක්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් අදහස් දක්වා නැත. | අයවිය යුතු හිඟ මුදල කඩිනමින් අයකර ගත යුතුය |
| (ඒ) | 2005/2006 මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ පෞද්ගලික හාල් මෝල් හිමියෙකුගෙන් ශ්‍රාවස්තිපුර ගොවිජන සේවා කාරක සභාවට ලැබීමට තිබූ රු.1,025,642 ක මුදලක් සම්බන්ධයෙන් වූ නඩු තීන්දුව අනුව 2012.07.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි වසර තුනක් ඇතුලත මාසිකව රු.30,000 බැගින් ගොවිජන සේවා කමිටුව වෙත එම මුදල ගෙවා නිම කිරීමට තීරණය කර තිබුණු නමුත්, තවදුරටත් රු.995,642 ක මුදලක් අය විය යුතුව තිබුණි. | රු. 995,642 ක මුදල ගෙවීම අතර මග නැවතී ඇති අතර එය සොයා බලා නැවත අයකර ගැනීම සඳහා කටයුතු කරන බව | අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාබනික පොහොර මෙට්‍රික් ටොන් 100 ක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.10,012,860 ක පිරිවැයක් දරා ගොවිජන සේවා කාරක සභා 12 ක් විසින් නිපදවා තිබුණු කාබනික පොහොර ප්‍රමාණයෙන් රු.3,635,016 ක විකුණුම් ආදායමක් පමණක් උපයා තිබූ අතර ඉතිරිව පැවති පොහොර තොගය මතුපිට පොලොවෙහි තැබීම හේතුවෙන් වල් බිහි වී පැවතීම සහ කල්ගත වීම හේතුවෙන් පොහොර වල ගුණාත්මක තත්ත්වය අඩු වීම නිසා අලෙවි කල නොහැකි තත්ත්වයේ පැවතුණි. | නිෂ්පාදන පිරිවැය ආවරණය කර ගැනීමට කටයුතු කරන බව | කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ව්‍යාපෘති සක්‍රියව පවත්වා ගත යුතුය |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 28 ක් වෙත 2021 වර්ෂයේ දී ලැබී තිබුණු කොම්පෝස්ට් හලන යන්ත්‍ර විගණිත දිනය වූ 2023 පෙබරවාරි 15 වන විටත් කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු සඳහා භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙම යන්ත්‍ර ලබා දුන්නද එය භාවිතා කිරීමට අවශ්‍ය ට්‍රැක්ටර් රථ ලබා දී නොමැති බව හා ඉදිරියේ දී භාවිතා කිරීමට කටයුතු කරන බව | යන්ත්‍ර කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය |
| (ආ) | දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ ගොවිජන සේවා කාරක සභා 03 ක් වෙත ගොයම් කැපීමේ යන්ත්‍ර 02 ක් සහ ගොයම් පැල සිටුවීමේ යන්ත්‍ර 10 ක් හා ඒ සඳහා ලැබී තිබුණු තැටි 16000 ක් ප්‍රයෝජනයට නොගෙන වසරකට වඩා වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී ගොයම් පැල සිටුවීමේ යන්ත්‍ර භාවිතාකර යාය ආදර්ශන සිදු කිරීමට කටයුතු යොදා ඇති බව | යන්ත්‍ර උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය |
| (ඇ) | 2021 හා 2022 වර්ෂ වලදී හොරොව්පොතාන ගොවිජන සේවා කාරක සභාව වෙත යන්ත්‍රෝපකරණ වර්ග 05 ක් යටතේ ලැබී තිබුණු උපකරණ 12 ක් විගණිත දින වූ 2023 මැයි 23 වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවති අතර මෙම යන්ත්‍ර අනාරක්ෂිතව මධ්‍යස්ථාන පරිශ්‍රයේ විය. | දේශගුණික සුහුරු වාරි ව්‍යාපෘතිය මගින් දැනට මධ්‍යස්ථාන භූමියේ යන්ත්‍ර උපකරණ ගාල් කිරීම සඳහා පරිශ්‍රයක් ඉදිවෙමින් පවතින බව | යන්ත්‍ර උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය |

## 4 ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා බල ප්‍රදේශ 28 ක් තුල පැවති ගොවි පවුල් ප්‍රමාණය 119,197 ක් වූ අතර, කාරක සභා බල ප්‍රදේශ වල සමස්ත ගොවි පවුල් ප්‍රමාණයට සාපේක්ෂව පෙරමඟ ළමා තැන්පතු ගිණුම් ප්‍රමාණය 1945 ක් ලෙස 1.63% ක් වැනි අඩු අගයක් විය. | කෘ.ප.නි.ස නිළධාරීන්ට වාර්ෂික ඉලක්ක ලබා දී ඇති අතර තව දුරටත් ඔවුන් දැනුවත් කරන බව | පෙරමඟ ළමා තැන්පතු ප්‍රමාණය වර්ධනය කර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ආ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරණ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයෙහි 2.6.2.(1) ඡේදය අනුව වසම් තුල කුඩා කණ්ඩායම් පිහිටුවීම හා ඔවුන් සක්‍රීය ලෙස ගොවිජන බැංකුව සමඟ දායක කරගැනීම වසම භාර කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර | කෘ.ප.නි.ස. නිළධාරීන්ට වාර්ෂික ඉලක්කක ලබා දී ඇති අතර තව දුරටත් ඔවුන් දැන්වත් කිරීමට කටයුතු කල බව | වසම තුල කුඩා කණ්ඩායම් පිහිටුවීමට හා ඔවුන් සක්‍රීය ලෙස ගොවිජන බැංකුව සමඟ දායක කර ගැනීමට කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර |

| | | | |
|---|---|---|---|
| | නිලධාරින්ගේ වගකීමක් වුවද, කාරක සභා බල ප්‍රදේශ 34 තුල ගොවි පවුල් 152,516 ක් පැවතිය ද ගොවිජන බැංකුව සමඟ සම්බන්ධ වී ගනුදෙනු කරන කුඩා කණ්ඩායම් ගණන 5302 ක් විය. | | නිළධාරීන් කටයුතු කල යුතු බව |
| (ඈ) | රඹෑව සහ කහටගස්දිගිලිය ගොවිජන බැංකු විසින් 2015/2016 වර්ෂයේ දී නිකුත් කර තිබුණු බඩඉරිඟු ණය මුදල්වලින් පිළිවෙලින් රු.578,271 ක් සහ රු.1,781,652 ක් වශයෙන් එකතුව රු.2,359,923 ක හිඟ ණය මුදලක් පැවති අතර, 2022 දෙසැම්බර් 31 වන විට වසර 06 කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද එම ණය මුදල් අයකරගෙන නොතිබුණි. | 2015/2016 බඩ ඉරිගු හිග ණය මුදල් අය කරගැනීමට හිග ණය ගොවීන් අධිකරණයට යොමු කර ඇති බව | හිඟ ණය අයකර ගැනීමට කටයුතු කල යුතු අතර කාලීනව ණය අයකර ගැනීමට කටයුතු කල යුතුය |
| (ඇ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 (ගොවි බැංකු) චක්‍රලේඛයේ 1.6 (ii) අනුව ගොවි ජනතාවගේ ඉතිරි කිරීමේ නැමියාව වර්ධනය කර ගැනීම හා ඒ තුලින් ඔවුන්ගේ ආයෝජන ශක්තිය වර්ධනය කිරීමට සහය වීම ගොවිජන බැංකුවේ අභිමතාර්තයක් වුවද, වර්ෂ ගණනාවක සිට මුදල් තැන්පත් නොවූ ගිණුම්, තැන්පතු මුදල රු. 100 පමණක් පැවති ගිණුම් හා ආරම්භක තැන්පතු මුදලට පමණක් සීමා වූ අක්‍රීය ගිණුම් 116 ක් පිළිබඳ ගොවිජන සේවා කාරක සභා 12 කට අදාලව විගණනයේදී සිදු කරන ලද නියැදි පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. | කෘ.ප.නි.ස. නිළධාරීන් දැනුවත් කර තැන්පතු වර්ධනය කිරීමට ක්‍රියා කරන බව | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කල යුතුය |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 07 ක 2016 වර්ෂයේ සහ ඊට පසුව ආරම්භ කරන ලද කාන්තා ගොවි සංවිධාන 317 න් 159 ක් ම ආරම්භක තැන්පතුවට පමණක් සීමා වී තිබුණි. | සක්‍රීය මට්ටමේ පවතින කාන්තා ගොවි සංවිධාන අනිවාර්ය තැන්පතු සිදු කරන අතර අනෙකුත් ගොවි සංවිධාන දිරි ගන්වා තැන්පතු ලබා ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව | ඉතුරුම් වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය |
| (ඊ) | 2012 පෙබරවාරි 29 දිනැති ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 04/2012 දරන චක්‍රලේඛයේ 3.4.2 ඡේදය අනුව කෘෂිකාර්මික ණය පියවීමේ උපරිම කාලය මාස 06 ක් වුවද, 1998/1999 මහ කන්නයේ සිට 2021/2022 මහ කන්නය දක්වා වූ වසර 01 සිට 24 දක්වා කාලය තුල ගොවිජන සේවා කාරක සභා 31 ක ගොවීන් 3421 දෙනෙකුගෙන් රු.57,921,279 ක හිඟ ණය මුදලක් අයවීමට තිබුණි. | එම හිඟ ණය ගොවීන් විනිශ්චය සභාවට හා අධිකරණයට යොමු කොට ඇති බව | හිඟ ණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| (උ) | කැකිරාව ගොවි බැංකුව විසින් නිකුත් කර තිබූ ව්‍යාපෘති ණය මුදලින් වසර 03 සිට වසර 08 දක්වා කාල පරාසයක සිට පැවත එන රු.2,316,570 ක් වූ හිඟ හිටි ණය ශේෂ 47 ක් 2022 දෙසැම්බර් 31 වන විටත් අයකරගෙන නොතිබුණි. | 2023 මැයි 24 දිනට වසර 03 සිට වසර 08 දක්වා කාල පරාසයක සිට පැවත එන රු. 1,329,829 ක් ණය ශේෂයක් ගොවීන් 29 කුගෙන් අයවිය යුතු බව | ණය අය කර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වා ගත යුතුයි |
| (ඌ) | 2001 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුල ආඩියාගල ගොවි බැංකුව විසින් අවස්ථා 161 කදී නිකුත් කර පැවති රු.1,064,497 ක කෘෂි ණය අය කර ගැනීම සඳහා ඊට අදාල ණය ඉල්ලුම් පත්‍ර, ගිවිසුම් පත්‍ර හා වවුචර් නොමැති වීම හේතුවෙන් විනිශ්චය සභාවට යොමු කල නොහැකිව පැවතුණි. | මෙම කාලය තුල නිකුත් කර තිබූ ණය මුදල් වලට අදාලව ණය ඉල්ලුම් පත් හා ගිවිසුම් පත් නිසි ලෙස සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් ණයකරුවන් සත්‍ය වශයෙන් සොයා ගැනීමට නොහැකි බව | ණය නිකුත් කිරීම් වලට අදාල ණය ඉල්ලුම් පත්‍ර හා ණය ගිවිසුම් පත්‍ර සහ වවුචර් ආරක්ෂිතව පවත්වාගෙන යා යුතුය |
| (එ) | මිහින්තලේ ගොවිජන බැංකුවේ ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතියට අදාල මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් 2013 වර්ෂයේ දී කරන ලද මු.රෙ. 104 (අ) පරීක්ෂණයට අනුව අය කර ගත යුතු මුදලින් නිළධාරීන් දෙදෙනෙකුගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.1,958,550 ක මුදලක් අය කර ගත යුතුව පැවතුණි. | මු.රෙ. 104 පරීක්ෂණයට අනුව එම නිළධාරීන් දැනුවත් කල ද මේ වන තෙක් එම මුදල් ගෙවා නොමැති බැවින් ප්‍රධාන කාර්යාලයද දැනුවත් කර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර දෙන මෙන් ඉල්ලා ඇති බව | අදාල මුදල කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතුය |
| (ඒ) | හිඟ ණය කරුවන් පිළිබඳ විශ්ලේෂණ වාර්තා සකස් කර ඊට අදාල ආකෘති මගින් තොරතුරු ලබා ගෙන හිඟ ණය කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතු වුව ද, පලාගල ගොවිජන බැංකුවේ රු.2,592,712 ක කල් පසු වූ ණය සම්බන්ධයෙන් විගණිත දින වූ 2023 අප්‍රේල් 24 වන විටත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | හිඟ ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ ණය කඩිනමින් අයකර ගැනීමට අදාල ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ඔ) | හොරොව්පොතාන ගොවිජන බැංකුවේ ණය ගිවිසුම් අස්ථානගත වීම හා ඇතැම් ගිවිසුම් අත්සන් කර නොමැති වීම හේතුවෙන් වර්ෂ 07 සිට වර්ෂ 20 දක්වා කාලයට අදාල එකතු වටිනාකම රු.551,394 ක් වූ ණය ශේෂ 50 ක් අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට නොහැකි වී තිබූ අතර ඊට වගකිව යුතු පාර්ශව සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්තුමන් දැනුවත් කර ඇති බව | ආයතනික පොත්පත් ලේඛන සුරක්ෂිතව තබා ගැනීමට කටයුතු කල යුතුය |

| | | | |
|---|---|---|---|
| **(ඕ)** | කැබිතිගොල්ලෑව ගොවිජන බැංකුව විසින් තැන්පත්කරුවන් 3355 දෙනෙකුගේ රු. 1,503,032 ක වටිනාකම් තැන්පත් පවත්වා ගෙන ගියද එම තැන්පත් සටහන් කිරීම සඳහා සුදුසු ආකෘතිය ප්‍රකාරව තැන්පත් ලෙජර පවත්වා ගෙන නොයාම සහ කාර්තු වශයෙන් තැන්පත් සඳහා පොලී ගණනය කිරීමට හා එම තැන්පත් ශේෂයන් යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කර ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | තැන්පත් ගිණුම් යාවත්කාලීනව පවත්වා ගත යුතුය |